**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 07 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 09 දින ද විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 04 දින සභාවේ ලේකම්වරිය වෙත යවා ඇත.

1.2 මතය

-----------------

මෙම වාර්තාවේ1.3ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදි සභාවේ ආදායම් සහ වියදම් ගිණුම් සඳහා පොදු ලෙජරයේ ගිණුම් පවත්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල පරිසර බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම රු.84,800 ක් ගිණුම්වලට ගෙන නොතිබුණ අතර, එකතුව රු.22,800 ක් වූ වියදම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව නිශ්චිතව හඳුනාගෙන නොතිබූ ලැබිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් රු,347,791ක් ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත වැටුප් වශයෙන් ගෙවන ලද රු. 1,349,107 ක් ලැබිය යුතු ආදායම් ආධාර ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු.165,147 ක වියදම් සඳහා උපචිත වියදම් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි වර්ෂයේ වියදම රු.165,147 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වල අගය ප්‍රාග්ධන ආදායමෙන් දායකවීමේ ගිණුමට සමානවිය යුතු නමුත් රු.24,028,123 ක වෙනසක් නිරික්ෂණය විය.

(උ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා වූ මාස 03 කට අදාලව ලද මුද්දර ගාස්තු, ඉකුත් වර්ෂයේ මුද්දර ගාස්තු ලෙස සලකා සමුච්චිත අරමුදල් ගිණුමට ගැලපුම් කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2. නොසැසඳුන ගිණුම්
-----------------------------
පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සේවක ණය ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ සේවකයන් වෙනුවෙන් ලබා දෙන ලද ආපදා ණය මුදල රු.1,950,000 ක් දැක්වෙන නමුත් මාසික ඒකාබද්ධ වැය සාරාංශ අනුව රු.1,990,580 ක් ලෙස දැක්වීමෙන් ශේෂයන් අතර රු.40,580 වෙනසක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ විවිධ අත්තිකාරම් රු.6,841,431ක් දැක්වෙන නමුත් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ශේෂපත්‍ර සටහන් අනුව එය රු.684,131 ක් ලෙස දැක්වීමෙන් ශේෂයන් අතර රු.6,157.300 ක වෙනසක් නිරික්ෂණය විය.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුමේ ගිණුම් ශේෂ 4 ක් ලෙජරයේ ගිණුම් ශේෂ සමඟ සැසඳීමේ දී එකතුව රු.29,149,962 ක් වූ වෙනසක් නිරික්ෂණය විය.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශනය අනුව අතැති තොගය රු.6,922,005 ක් දැක්වෙන නමුත් සමීක්ෂණ මණ්ඩල වාර්තා, තොග පොත් හා පාරිභෝජන ද්‍රව්‍ය ලේඛණය අනුව තොග ශේෂය රු.1,080,262 ක් වීමෙන් තොග වටිනාකමෙහි රු.5,841,743 ක වෙනසක් නිරික්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු කසල බදු ලෙස රු.158,850 ක් ගිණුම් ගත කර තිබූ නමුත් කසල බදු ලේඛණය අනුව ලැබිය යුතු කසල බදු අදායම රු.139,600 ක් වීමෙන් ලැබිය යුතු කසල බදු අදායම රු.19,250 ක වෙනසක් නිරික්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------
පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ දී පළාත් සභා ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වෙත ලබාදුන් රු.1,560,000 ක් වූ යතුරුපැදි ණය මුදලින් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 08 දෙනෙකු වෙත ලබාදුන් රු.72,288 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි.

(ආ) රු.18,147 ක් වූ ණය මුදාලීමේ ගිණුම නමින් වූ ශේෂයක් 2002 වර්ෂයේ සිට නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙනවිත් තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
---------------------------------------
අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොවීම නිසා රු.7,468,344 ක් වූ වත්කම් හා රු.1,467,015 ක් වූ බැරකම් ශේෂ සත්‍යාක්ෂණය කිරිමට හෝ පිලිගැනිමට නොහැකි විය.

1.3.5 නිතීරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය

| නිතීරීති ,රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2013 ජුනි 05 වන දිනැතිඅංක PCMO/PR/2013 දරණ ජනාධිපති ලේකම්වරයාගේ ලිපිය | රාජ්‍ය ආයතන වල නිකරුනේ තිබෙන ප්‍රයෝජනයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමට කටයුතු කළයුතු වුවත් ගර්හිත තත්ත්වයේ පවතින අංක 151-4313 දරණ යතුරු පැදිය හා අංක 53 – 5630 දරන කැබ්රථය සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 සහIAI/2002/02දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ආයතනය සතුව පවතින රු. 258,118ක් වටිනා පරිගණක හා උපාංග පරිගණක වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,039,252 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.1,846,670 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 10,885,922ක වර්ධනයක් ඇති වී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමස්ත පුනරාවර්තන ආදායම රු. 13,361,408 කින් වැඩිවීමත්

, මෙහෙයුම් හා උපකරන සහ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව වෙනුවෙන් කළ වියදම ඉකුත් වර්ෂයට වඩා රු. 617,402 කින් අඩු වී තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

## 2.3.1 අදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය (රු.) |
|---|---|---|
| වරිපනම් හා බදු | 90,000 | 125,764 |
| බදු කුලි | 36,000 | 4,220 |
| ජල ආදායම් | 4,500,000 | 3,451,313 |
| වරෙන්තු හා දඩ | 400,000 | 273,576 |
| දඩ(උසාවියෙන් ලැබෙන මුදල්) | 1,500,000 | 1,500,000 |
| මුද්දර ගාස්තු | 7,500,000 | 7,500,000 |

## 2.3.2 වරිපනම් බදු

(i) 2013 හෝ ඊට පෙර වර්ෂ සඳහා හිඟව තිබූ වරිපනම් බදු 53,568 ක් කාලීනව අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව සභාව මඟින් විවිධ පහසුකම් සපයන අලුත්නුවර, රත්මලවින්න වැනි ප්‍රදේශවල මේ දක්වා වරිපනම් බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------

(i) 2014 අප්‍රේල් මස සිට අගෝස්තු මස දක්වා අයවිය යුතු යැයි හඳුනාගෙන ඇති රු.2,892,200 ක් වූ මුද්දර ගාස්තු හා 2014 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් දක්වා හඳුනාගෙන නොමැති මුද්දර ගාස්තු නිසි පරිදි හඳුනාගෙන සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ගෙන්වා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) 2003 වර්ෂයේ සිට 2014 මාර්තු දක්වා කාලය තුළ අයවූ ගාස්තුව සහ අයවිය යුතු මුද්දර ගාස්තු වටිනාකම අතර රුපියල් 1,871,294 ක වෙනසක් පැවතුනි.

(iii) 2014 වර්ෂයේ උසාවි දඩ මුදල් රු.347,791 ක් නිසි පරිදි හඳුනාගෙන අදාළ බලධාරීන්ගෙන් ගෙන්වා ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

2.3.4 වෙනත් ආදායම්
-------------------

(i) 2014 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබූ හිඟ කසල බදු වටිනාකම රු.139,350 ක් විය.

(ii) සභාව සතු ජල යෝජනා ක්‍රම 10 කින් 2014 දෙසැම්බර් 31 දිනට රු 2,641,232 ක මුදලක් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණු අතර, ජලය විසන්ධි කිරීම තුලින් පාරිභෝගිකයන් හැත්තෑදෙදෙනෙකුගෙන් රු.134,643 මුදලක් 2015 පෙබරවාරි මාසය දක්වාත් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

3.1. කළමණාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති ix වන අධිකාරියේ 185 රීතිය අනුව කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල සෑම මසකට සභාව ඉපයූ අදායමින් රුපියල් ලක්ෂ 05 සිට 10 දක්වා මුදලක් බලංගොඩ ලංකා බැංකු ශාඛාවේ පවත්වාගෙන යනු ලැබූ ජංගම ගිණුම් දෙකක පොලී ලැබීමක් නොමැතිව නිශ්ක්‍රියව රඳවාගෙන තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව, ඉඩම් විකිණීම මත විකුණුම් මිලෙන් අයකර ගත යුතු 1% ක් වන වටිනාකම වශයෙන් අයකර ගත යුතු රු.345,051 ක බදු අයකර ගෙන නොතිබුණි.

(ඇ) සභාවට අයත් ජල ව්‍යාපෘති වල සවිකරන ලද ජල මෝටර් 14 ක් සහ අනෙකුත් උපකරණ වල වටිනාකම ගණනය කර ඉන්වෙන්ට්‍රි ගතකර නොතිබුණි.

(ඈ) සභාවට අයත් අළුත්නුවර හා ඉඹුල්පේ යන ප්‍රදේශයන්හි ගවයන් විශාල වශයෙන් කොළඹ බදුල්ල ප්‍රධාන මාර්ගයෙහි නිදැල්ලේ හැසිරෙන බවත් ඒ හේතුවෙන් එම සතුන්ගේ ජීවිතවලට මෙන්ම වාහනවලටද අනතුරු සිදුවීමේ අවදානමක් පවතින බවත් නිරීක්ෂණය වූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පියවර ගෙන නොතිබුණි. මේ සඳහා 2014 වර්ෂයේදී රු.25,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම ප්‍රතිපාදන වර්ෂය අවසානය දක්වාත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.2. කාර්යමණ්ඩල පරිපාලනය
-------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව කළමනාකරණ සහකාර අධිශ්‍රේණියේ ලේඛම් තනතුරක පුරප්පාඩුවක් පැවති අතර අදාල සුදුසුකම් සහිත නිලධාරියෙක් පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ ආදායම් පරීක්ෂක නිලධාරී තනතුරු 02ක පුරප්පාඩුව පැවතියද අදාළ තනතුරු වල වැඩ ආවරණය ක්ෂේත්‍ර කම්කරුවෙකුට පවරා තිබුණි.

3.3 නිෂ්ක්‍රිය/ඌන උපයෝජිත වත්කම්
-------------------------------------
ප්‍රදේශීය සභාව සතු වාහන 05ක් සහ යන්ත්‍රෝපකරණ 04 ක් නිශ්කාර්යව පැවතින.

3.4 ප්‍රමාද වූ ව්‍යාපෘති

----------------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ දොරින් දොරට - ගමින් ගමට ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික සැලැස්ම යටතේ ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සංවර්ධනය සඳහා ව්‍යාපෘති 50 ක් වෙනුවෙන් රුපියල්.20,200,000ක ප්‍රතිපාදන වෙන් වී තිබුණ ද 2015 ජනවාරි 31 දිනට ප්‍රගතිය සළකා බැලීමේදී රු.11,400,000 ක් වටිනාකමකින් යුත් ව්‍යාපෘති 29 ක වැඩ ආරම්භකර නොතිබුණු අතර,එය වෙන්කරන ලද ප්‍රතිපාදන වටිනාකමින් සියයට 56 ක් විය.

3.5 පාරිසරික ගැටළු

--------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී කැලි කසළ අපහරණය කිරිම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත රු.87,420 ක් ගෙවා තිබු නමුත්,කසල අවිධිමත් පරිදි කුණු වලට බැහර කර තිබු අතර ඒ සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දින කිහිපයකදී රැගෙන එන ලද කැලි කසල කුණු වල තුලට දමා වසා නොදැමීම හේතුවෙන් ප්‍රදේශය පුරා දූර්ගන්ධය පැතිරි තිබුණි.

(ආ) දිරාපත් නොවන පොලීතීන්, ප්ලාස්ටික් බඳුන් වෙන් කිරිමක් කර ඒවා ප්‍රතිචක්‍රිකරණයට යොමුකිරීම හෝ ඒවා විනාශ කීරීම සඳහා නිසිපියවර නොගෙන කුණුවලට දැමීම හේතුවෙන් පරිසරයට අහිතකර ලෙස බලපා තිබුණි.

(ඇ) ප්ලාස්ටික් බඳුන් ඒ අකාරයෙන්ම කුණුවලට දැමීම හේතුවෙන් එම බඳුන් වල වැසි වතුර එක් රැස්වීම තුල මදුරුවන් බෝවීමේ අවදානමක් ද පැවතුණි.

04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තුගත වියදම්,තත්‍ය වියදම් සමඟ සැසඳීමේ දී පුනරාවර්තන වැය වැඩසටහන් 04 ක් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 11 සිට සියයට 35 දක්වා වූ විචලනයක්ද ප්‍රාග්ධන වැය වැඩසටහන් 03 ක් සඳහා වෙන්කර තිබුණ ප්‍රතිපාදන වලින් සියයට 12 සිට සියයට 76 දක්වා ද සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

(ආ) 2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.2 වගන්තිය ප්‍රකාරව 2014 වර්ෂය සඳහා අතිකාල වියදම් ඒ සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන තුල කළමණාකරනය කර ගත යුතු නමුත් අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා අයවැය ප්‍රතිපාදනයෙන් ලබාදි තිබු රු.60,000 කට අමතරව 2014 අගෝස්තු 06 දින මාසික මහා සභා තීරණය අනුව තවත් රු.65,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 108 ක් වේ.

(ඇ) ප්‍රාග්ධන වියදම් වැය විෂයය යටතේ ඖෂධ උයන් සැකසීම සඳහා රු.25,000 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අදාල කාර්යය සම්බන්ධයෙන් භෞතික හෝ මූල්‍ය ප්‍රගතියක් දක්නට නොලැබුණි.

05. පද්ධති හා පාලන

------------------------

පහත සඳහන් පද්ධති පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කරණු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) මානව සම්පත් කළමනාකරණය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) වාහන උපයෝජනය